# බළන්ගොඩ නගර සභාව

## 2019-11-26 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** - **2019.11.26**

**වේලාව** - **පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරී සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරුන්, මාධ්‍යවේදීන් ඇතුළු සියළු දෙනා පිළිගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බළන්ගොඩ නගර සභාවේ 2020 මුදල් වර්ෂය සඳහා 2019 නොවැම්බර් 26 වන දින සභාගත කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අලලා පවත්වන ලද 2020 වර්ෂයේ අයවැය කථාව සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙවර කෙටුම්පත් අයවැය ලේඛනයෙහි සිදු කළ යුතු සංශෝධනයන් පවතීනම් පෙන්වා දෙන ලෙසත්, අවශ්‍ය සංශෝධනයන් සිදු කළ හැකි බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් 2019 අයවැයෙන් ප්‍රකාශ කළ කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොදුන් අතර තම පාලන සමයේදී දේශීය ණය අරමුදලින් ණය ලබා ගනිමින් සැලසුම් සහගතව බළන්ගොඩ බස්නැවතුම්පල ඉදි කරමින් පැවතිය ද තම රජය 2002 වර්ෂයේ දී පරාජය වූ බැවින් ඉන් අනතුරුව පැමිණි ගරු සභාපතිතුමා මෙම ව්‍යාපෘතිය අසාර්ථක බවට ලිපි හුවමාරු කරමින් බස් නැවතුම්පල විවෘත නොකර වසරක කාලයක් සිටි බැවින් එම වසරට කෝටි එක හමාරක පමණ අලාභයක් සිදු වූ බව පවසන ලදී.

අනතුරුව නාගරික සංවර්ධන අධිකාරියෙහි නිළධාරින් සමඟ සාකච්ඡා කළ පසු බස්නැවතුම්පළ ටෙන්ඩර් කර කෝටි 09 ක මුදලක් ලබා ගත් නමුත් සෑමවිටම මෙය අසාර්ථක යැයි පැවසීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගත් බව පැවසීය. එමෙන්ම ස්වර්ණ පුරවර සම්මානය අහිමි වූයේ තමා එම තරඟයට සහභාගී නොවීමට ගත් තීරණය නිසාවෙන් මිස බස්නැවතුම්පල සඳහා ගත් ණය නොගෙවීම මත නොවන බව වැඩිදුරටත් පවසන ලදී.

කාර්යසාධන තරඟයෙන් ප්‍රථම ස්ථානය කෑගල්ලට ලබා දී මෙම සභාවට දෙවන ස්ථානය ලබා දුන් බැවින් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්තුමිය සහාව සමඟ අමනාප වී ඉන්පසුව පැවැත් වූ කාර්යසාධන තරඟ සඳහා ඉදිරිපත් නොවූ අතර එම කාල සීමාවේ දී රත්නපුර දිස්ත්‍රික්කයේ කිසිදු ආයතනයකට ජයග්‍රහණය ලබා ගැනීමට නොහැකි වූ බව පැවසීය. අනතුරුව නැවත වසර කිහිපයකට පසු මෙම තරඟය සඳහා අප සභාව සහභාගි වූ අතර ඉන් පසුව සබරගමුවේ ප්‍රථම ස්ථානය හා ලංකාවෙන්ම තෙවන ස්ථානයත් ඊට පසු වසරේ ලංකාවෙන්ම දෙවන ස්ථානයත්, 2015 වසරේ ලංකාවෙන්ම ප්‍රථම ස්ථානයත් ලබා ගත් බව පවසන ලදී.
එමෙන්ම මෙම ණය මුදල නොගෙවීම එවකට සිටි සභාපතිවරයාගේ වරදක් වන බව ද ඔහු එම ණය මුදල ගෙවමින් සිටියේ නම් තමන් සභාපති ලෙස පත් වී පැමිණි දා සිට එම මුදල දිගටම ගෙවා ගෙන යන බව පැවසීය.

2018 වසරේ මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දුන් නමුත් පසුගිය වසරේ කිසිදු මන්ත්‍රී ප්‍රතිපාදනයක් නොලැබුණු අතර ආණ්ඩුව හා නගර සභාව පැති දෙකකට ගමන් කළ බව පැවසීය. තම පක්ෂයේ සහයෝගයෙන් සභාව පිහිටවූ නමුත් ගම්පෙරළිය යටතේ ලබා දුන් මුදල් කිසිවක් තම පක්ෂයට නොලැබුණු බව ද එමෙන්ම 2019 වර්ෂයට අදාලව වැසිකිළි ආධාර නොලැබුණු බව ද. මෙම අයවැය පිළිබඳ විශ්වාසයක් නොමැති නිසා අයවැයට විරුද්ධ වන බව ද පවසා සිටින ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා**

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා , කුමන ස්ථානයක වුවද කථා කළ හැකි ආකාරයේ අයවැයක් නිර්මාණය කිරීම පිළිබඳ ලේකම්තුමියට, ගණකාධිකාරිතුමාට හා එතුමාගේ කාර්ය මණ්ඩලයට ප්‍රථමයෙන්ම ස්තුතිය පළ කරන බව පැවසීය. එමෙන්ම 2018 වර්ෂයේදී සභාව පත්වන විට ද එම වසරේ අයවැය සකස් කර අවසන්ව තිබූ බව ද එමගින් එක් කොට්ඨාශයක් සංවර්ධන කිරීම සඳහා ලක්ෂ 10 ක මුදලක් වෙන් කර තිබූ බව ද සඳහන් කල ගරු උප සභාපතිතුමා ඒ වෙනුවෙන් ලේකම්තුමියට හා ගණකාධිකාරිතුමාට තම ස්තුතිය පුද කරන බව සඳහන් කරන ලදී.

2006 වර්ෂයේ නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා සභාපති වශයෙන් පත්ව සිටි සමයේ ආණ්ඩුකාර වශයෙන් සිටි ගරු මොහාන් එල්ලාවල මැතිතුමා සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 30ක මුදලක් ලබා දුන් අතර එම අවස්ථාවේ දී දැනුණ සතුටම 2018 වර්ෂයේ අයවැය මගින් දැනුණු නමුත් එය පොතකට පමණක් සීමා වූ අතර සංවර්ධන කටයුතු සඳහා තමන්ට ලැබුණේ ලක්ෂ 4 ක් පමණක් බව පවසන ලදී. එමෙන්ම මෙවර අයවැය කථාව තුල 2019 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන තුලින් සිදු කරන කිසිදු සංවර්ධනයක් පිළිබඳ සඳහනක් කර නොමැති අතර 2019 වර්ෂයේ කිසිදු මන්ත්‍රී ප්‍රතිපාදනයක් ලබා නොදුන් එකම සභාපතිතුමා බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා බව පවසන ලදී.

ඉතා දුෂ්කර දුප්පත් ප්‍රාදේශිය සභාවක් වන බළන්ගොඩ ප්‍රාදේශිය සභාවේ සෑම කොට්ඨාශයක් සඳහාම රු.100,000.00 ක මුදලක් හා ජේසීබී යන්ත්‍ර පැය 80 ක් නොමිලේ ලබා දී ඇති නමුත් මෙම සභාව විසින් ණය ගෙවීම සිදු කල යුතු යැයි පවසමින් මන්ත්‍රී ප්‍රතිපාදන ලබා නොදීමට කටයුතු කළ ද එම ණය ගෙවීම සඳහා හෝ ගරු සභාපතිතුමා පත් කළේ මහජනතාව බැවින් ප්‍රථමයෙන් මහජනතාවට සේවය කළ යුතු බව පවසන ලදී. ගරු සභාපතිතුමා විසින් සිදු කරනු ලබන රුපියල් ලක්ෂ 05 දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා දීම සඳහා තම පක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුන් දෙදෙනා විරුද්ධ වුණු අවස්ථාවල දී ද ගරු සභාපතිතුමා 100% ක්ම විශ්වාස කර තම කැමැත්ත ලබා දුන් නමුත් තමා බලාපොරොත්තු වූ පරිදි සංවර්ධනය සඳහා මුදල් නොලැබුණු බවත් 2019 වර්ෂයේදී ආණ්ඩු පක්ෂය වශයෙන් හෝ කිසිදු මන්ත්‍රී ප්‍රතිපාදනයක් නොලැබුණු බවත් එම නිසා මෙම වසරේ එක් මන්ත්‍රීවරයෙකු සඳහා රුපියල් ලක්ෂ 3 ක මුදලක් ලබා දීම පිළිබඳ කිසිම විශ්වාසයක් නොමැති බව සඳහන් කළේය.

බළන්ගොඩ නගරයට ඉතා අත්‍යවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා ගැනීම හා ක්‍රීඩා පිටිය නඩත්තුව සඳහා ලක්ෂ 15 ක මුදලක් වෙන් කර ඇති නමුත් ඒ සඳහා කෝටි 5 පමණ මුදලක් අවශ්‍ය වනු ඇති බව

පැවසූ ගරු උප සභාපතිතුමා කාර්පාක් රථ ගාල පිළිබඳව ද මෙම අයවැය ලේඛනයෙහි කිසිදු සඳහනක් නොමැති බව පැවසීය. සංවර්ධනය සඳහා ගම්පෙරළිය වැඩසටහන යටතේ ලක්ෂ 124 ක් වියදම් කළ බව සඳහන් කළ නමුත් ආණ්ඩු පක්ෂය වශයෙන් කටයුතු කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහා ඒ තුලින් කිසිදු මුදලක් නොලැබුණු බව ද එක්සත් ජාතික පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකු තම පක්ෂයේ කිසිවෙකුගෙන් කිසිම සංවර්ධන යෝජනාවක් නොඉල්ලූ බව ද පැවසීය. එමෙන්ම 2019 වර්ෂයේ අයවැය සඳහා යෝජනා 27 ක් ලබා දුන් අතර එම යෝජනා අතුරින් එක් කර්මාන්තයක එක් කොටසක් පමණක් ඉටු කර ඇති අතර හිටපු ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරල මැතිතුමිය විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කිසිවෙකුට කිසිම ප්‍රතිපාදනයක් ලබාදීමට අවශ්‍ය නොමැති බව ප්‍රකාශ කර ඇති නමුත් ඇතැම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයන් වැරදි මාර්ගයෙන් හෝ එතුමිය හරහා සාම විනිසුරු පදවි ද ලබා ගෙන ඇති බව පවසන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂ සභාපතිවරයෙකු සිටින එකම සභාව වශයෙන් ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය එක්ව සමගියෙන් කටයුතු කරන සභාවක් වශයෙන් ද හැඳින්විය හැකි නමුත් පුබුදමු ගම්මැද්ද වැඩසටහන මගින් දෙහිගස්තලාව වසමට අසාධාරණයක් කළ අතර ඇතැම් දෙහිගස්තලාව වසමෙහි ඇතැම් සංවර්ධන කටයුතු තමාව දැනුවත් නොකර එක්සත් ජාතික පක්ෂය විසින් ක්‍රියාත්මක කර ඇති බව ද පවසන ලදී.

සභාව විසින් සමහර තීන්දු ගැනීමේදී මෙන්ම ඉතා වැදගත් රැස්වීම් පැවැත්වීමේදී උප සභාපති වශයෙන් තමාහට කිසිම දැනුවත් කිරීමක් සිදු නොකරන බැවින් මෙම සභාව එක් පුද්ගලයෙකු මත පවත්වා ගෙන යාම සුදුසු නොවන බව සඳහන් කළේය. එමෙන්ම 2019 වර්ෂය සඳහා වැසිකිළි ආධාර නොලැබූ බව ද දෙහිගස්තලාව කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදු කරන අවස්ථාවේදී ඒ සම්බන්ධව තමා සමග කිසිදු සාකච්ඡාවක් සිදු නොකළ බව ද එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් ශක්තිමත් කිරීම සඳහා පමණක් සංවර්ධන කටයුතු සිදු කළ බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**</u>

ලක්ෂ 69 ක් ඡන්ද ලබා දෙමින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දිනවූ ඡන්දදායකයන් සියළු දෙනාටම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසමින් තම අදහස් දැක්වීම ආරම්භ කළ ගරු මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමාගේ අයවැය කථාව හොඳ කථාවක් නමුත් එතුමා සභාපති ධූරය දරන අවුරුදු එක හමාරක පමණ කාලයක සිට මෙවැනි නිර්මාණශීලී දැක්මක් තිබුණානම් අනිකුත් මන්ත්‍රීවරු මේ ආකාරයේ අදහස් ප්‍රකාශ නොකරන බව පවසා සිටින ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමාට තරුණ නායකයෙක් වශයෙන් නව අදහස් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබූ අතර ගරු සභිකයන් සමඟ සාමූහිකව කටයුතු කළා නම් දිගු ගමනක් යාමට හැකිව තිබූ නමුත් සභාවේ වැඩසටහන් ආදිය පිළිබඳ ගරු උප සභාපතිතුමා දැනුවත් නොවීම බරපතල අඩුපාඩුවක් බව පවසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමා තම පක්ෂයේ පිරිසට ද කෙනෙහෙළිකම් කළ අතර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බළන්ගොඩ නගර සභා කොට්ඨාශ දහයෙන් කොට්ඨාශ හතක් ජයග්‍රහණය කර තිබුණ ද එක්සත් ජාතික පක්ෂ සභාපතිවරයෙක් පත්වීම හේතුවෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වූ නිසා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ආසන සංවිධායක ලෙස තමන් කණගාටුවට පත් වූ බව පවසන ලදී.

එනමුත් තරුණයෙක් ලෙස ගරු සභාපතිතුමාගේ පැමිණීම පිළිබඳ සතුටු වූ අතර නගර සභා සේවකයින් අට දෙනෙකු බඳවා ගැනීමේ දී සහයෝගය ලබා දීම සම්බන්ධව තමන්ට දෝෂාරෝපණ පැමිණි නමුත් තම කණ්ඩායමේ සාමූහික සහයෝගය ලබා දීමට කටයුතු කළ බව පවසන ලදී.

සුනඛ මර්දනය, අයාලේ යන හරක් හා මදුරු මර්දනය පිළිබඳව සභාවේ කථා කළ අතර ඒ පිළිබඳවද ප්‍රගතියක් නොමැති බව සඳහන් කල ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අද වන විට දවල් කාලයේදී ද බළන්ගොඩ නගරයේ මදුරුවන් විශාල වශයෙන් දැකිය හැකි බැවින් ව්‍යාපාරිකයන් හා වාණිජ බැංකු සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ සහයෝගය ද ලබා ගනිමින් මදුරු මර්දනය සිදු කළ හැකි බව ද බළන්ගොඩ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් විශාල සංඛ්‍යාවක් සිටින බව ද පවසන ලදී.

කෙදිනක හෝ තමන් නගර සභාවේ සභාපති වූවා නම් සුනඛ මර්ධනය, අයාලේ යන හරක් හා මදුරු මර්දනය සිදු කිරීම මෙන්ම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම තම මුල්ම කාර්යයන් ලෙස සිදු කරන බව ද කුමන ව්‍යසනයක දී වුව ද බදුලු මාර්ගයෙහි යට නොවන එකම නගරය බළන්ගොඩ නගරය වන බව ද සඳහන් කළේය. එමෙන්ම බළන්ගොඩ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම තුළින් බළන්ගොඩ නගරයේ තරුණ තරුණියන්ට පමණක් නොව එ තුලින් සභාවට ද විශාල ආදායමක් උපයාගත හැකි බව පවසා සිටින ලදී.

ට්‍රැක්ටර් මගින් කසළ එකතු කිරීමට නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා Truck රථයක් මිලදී ගැනීමට එක්සත් ජාතින පක්ෂයේ මන්ත්‍රීවරියක්ම ගෙන ආ යෝජනාව තවම ඉටු නොවුණු අතර Stram තාක්ෂණය ජනතාවට තිබෙන එකම ප්‍රශ්නයදැයි විමසා සිටින ලදී.

නගර සභා සීමාව තුල කුඩා වපසරියක් පමණක් ඇති බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ කාණු පද්ධතියේ හැම විටම ජලය පිරී ඩෙංගු මදුරුවන් ඇති වීමේ ප්‍රවණතාවයක් පවතින බව ද අවිධිමත් පොස්ටර් ප්‍රදර්ශනය වැළැක්වීම සඳහා අඩි 20 ක් දිග හා පළල ඇතිව දැන්වීම් පුවරු සකස් කර දෙන ලෙස මීට පෙර අවස්ථාවක ඉල්ලීමක් කළ නමුදු එය තවමත් ක්‍රියාත්මක කර නොමැති බව ද පදික වෙළෙන්ඳන් සඳහා ලබා දුන් කඩකාමර සඳහා විදුලි සැපයුම ලබා නොදීම නිසා සවස් කාලයෙන් පසු ජනතාව එම කඩ සඳහා නොයන බැවින් එම වෙළෙඳුන් නැවත පදික වෙළඳාම සඳහා යොමුව ඇති බව ද පවසන ලදී.

එමෙන්ම විපක්ෂයේ සභිකයන් සියළුම දෙනාහට කුඩම්මාගේ සැලකිලි ලැබුණු නමුත් අනෙකුත් පළාත් පාලන ආයතන තුල එසේ සිදු නොවන බවත්, ගරු සභාපතිතුමා ගිය වසරේදී මෙම අයවැය

ඉදිරිපත් කළා නම් මෙවැනි විරෝධයක් පැණ නොනගින බවත් පවසන ලදී. එමෙන්ම තමා ගරු සභාපතිතුමාගේ තරුණ නායකත්වයට සහයෝගය ලබා දුන් නමුත් උඩ ඇල්ලෙපොල වෙළගේ පුරාණ රජමහ විහාරස්ථානයට අවශ්‍ය කරන සිමෙන්ති මිටි 30 ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ නමුත් මේ වන තෙක් එය නොලැබුණු බව ද, තුඹගොඩ සාංඝිකාරාමයේ පෙරහැර සඳහා ලබා දීමට අනුමත වූ රු.30,000.00 ක මුදල මේ වන තෙක් ලබා දී නොමැති බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වූ ගරු මන්ත්‍රීතුමා, ජනතාව අපේක්ෂා කළ සේවය ලබා දුන්නේ ද යන්නෙහි ගැටළුවක් පවතින අතර ගරු සභාපතිතුමාගේ ක්‍රියාකලාපය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බව පවසන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ පක්ෂයක් ලෙස සියළු පළාත් පාලන ආයතන වල බලය ලබා ගැනීම සඳහා සාමූහික තීන්දුවක් ගෙන ඇති අතර එය ගරු සභාපතිතුමා සමඟ පවතින පෞද්ගලික ගැටළුවක් නිසා නොව දේශපාලනික අරමුණින් ගත් තීරණයක් බව පැවසීය. ඒ අනුව ඉදිරියේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එකතු වී මෙම සභාවේ බලය ලබා ගන්නා බව වැඩිදුරටත් පවසන ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**</u>

"දේශපාලනයේ සදකාලික හතුරෝ ද සදා කාලික මිතුරෝද නැත" යැයි පවසමින් තම අදහස් දැක්වීම ආරම්භ කළ ගරු මන්ත්‍රීතුමා පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ මෙන්ම මෙම සභාවේ ද විශාල කැප කිරීමක් කර මෙම අය වැය සකස් කර ඇති නමුත් සභාව පැවැත්වීමට දින 07 කට ප්‍රථම මෙම කෙටුම්පත් අයවැය ලබා දීමට කටයුතු සිදු නොකර අද දින ලබා දීමෙන් මෙහි නිවැරදිභාවය බලන්නේ කෙසේද යන්නත් විමසා සිටින ලදී.

එමෙන්ම දින 51 ආණ්ඩුව පිහිටුවා අගමැති ලෙස පත්වූ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට බහුතරය නොමැති වීම හේතුවෙන් එම තනතුර නොලැබුණු නමුත් ගරු සභාපතිතුමාට පූරුවේ පිනක් නිසා අවුරුදු එක හමාරකට නගර සභාවේ සභාපති ලෙස කටයුතු කිරීමට හැකි වූ අතර එමගින් එදා බහුතරය ලබා ගත් තම පක්ෂයේ අයිතිය නැති වූ බව පැවසීය. එමෙන්ම මෙම අයවැය මඟින් ජනතාවට ලබා දී ඇති සහනය කුමක්දැයි විමසා සිටි ගරු නාගරික මන්ත්‍රීතුමා බස්නැවතුම්පල වැසිකිලි පද්ධතිය අක්‍රමවත් බැවින් ඒ සඳහා එවකට සිටි ගරු සභාපතිතුමා හා අධීක්ෂණ නිළධාරීන් වගකිව යුතු බව පෙන්වා දෙන ලදී.

එමෙන්ම මෙවර අයවැය මඟින් මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස එක් අයකුට රුපියල් ලක්ෂ 03 බැගින් ලක්ෂ 51 වෙන් කර ඇති බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා, සභාව පවත්නා වර්ෂ හතර සඳහාම මාසික දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව සඳහා ගරු සභාපතිවරයා සඳහා රු.1,444,000.00 ක මුදලක් ද ගරු උප සභාපතිතුමා සඳහා රු.1,344,000.00 ක මුදලක් ද එක් මන්ත්‍රීවරයෙකු සඳහා රු.1,104,000.00 ක් ද වන සේ වර්ෂ හතරම සඳහා සියලු දෙනා රු.19,444,000.00 මුදලක් ලබා ගන්නා බව පැවසීය. නමුත් එක් මන්ත්‍රීවරයෙකු සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රුපියල් ලක්ෂ 03 ක් පමණක් ලබා දී ඇති අතර මෙම අයවැය බොරු, ශෝබන මෙන්ම නිවැරදි අයවැයක් නොවන බව පෙන්වා දෙන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, තම කොට්ඨාශය සිදු කල සංවර්ධනයන් පිළිබඳව නොදන්නා බවට එක්සත් ජාතික පක්ෂයේම මන්ත්‍රීවරුන් චෝදනා කරන බව ද තමන්ට තිබෙන අයිතිය අනුව තම මතය අද දින මෙම සභාවේදී ප්‍රකාශ කරන බව ද පැවසීය. එමෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බළන්ගොඩට පැමිණි අවස්ථාවේදී මෙම සභාවේ 2020 වර්ෂයේ අයවැය පරාජය කරන බවට එතුමාට පොරොන්දු වූ බව පැවසූ අතර මෙම අයවැය දෙවන වර සභාගත කරන අවස්ථාවේදීද එය පරාජය කරමින් ඉදිරියේදී වියදම් අනුමත නොකරන බවත් නගර සභාවේ බලය තම පක්ෂය වෙත ලබා ගනිමින් ජනතාවට සේවය කරන බවත් පවසන ලදී.

ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ඉදිරියේදී පවත්වන පළාත් සභා මැතිවරණය මෙන්ම මහ මැතිවරණය ද ජයග්‍රහණය කරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා නගර සභා ආඥා පනතේ 19 වන වගන්තිය හා 2012 වසරේ නව සංශෝධනය අනුව තම පක්ෂයට අවස්ථාව ලබා දෙන ලෙසත් අද දින අයවැයට විරුද්ධව තමන් ඡන්දය භාවිතා කරන බවත් පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

එමෙන්ම 2020 වර්ෂයේ අයවැය පළමුවර කියවීම සඳහා ඡන්දයක් පැවැත්වීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා</u>

සුරක්ෂිත රටක්, සෞභාග්‍යමත් දේශයක් නිර්මාණය කිරීම සඳහා හත්වන විධායක ජනාධිපති ලෙස ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ඡන්දය භාවිතා කළ සියළු දෙනාට ගෞරවය ප්‍රණාමය හා ස්තුතිය පුද කළ ගරු නාගරික මන්ත්‍රීතුමා 2018 පළාත් පාලන මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් නගර සභා කොට්ඨාශ දහයෙන් හතක් ජයග්‍රහණය කළ ද යම් යම් දේශපාලන හේතූන් මත නගර සභාවේ බලය ලබා ගැනීමට නොහැකි වූ නමුත් නව සභාපති පිළිබඳ විශ්වාසයක් තිබූ බව පවසන ලදී.

2018 වර්ෂයේ අයවැය මඟින් ලබා දුන් ප්‍රතිපාදන මඟින් කිරිඳිගල කොට්ඨාශයට ජලය ලබා දී මාර්ග සංවර්ධනය කළ අතර 2019 වර්ෂයේදී ද ගරු සභාපතිතුමාගේ හා ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපාදන මත අබලන්ව තිබූ වැලිහරනාව මාර්ගය සංවර්ධනය කිරීමට හැකි වූ බැවින් ඒ සඳහා ස්තුතිය පුද කර සිටින ලදී.

එමෙන්ම 2020 වර්ෂයේ අයවැය සඳහා ගරු සභාපතිතුමන් විසින් කාලීන යෝජනා පහක් ඉදිරිපත් කර ඇති අතර එමඟින් බළන්ගොඩ බදු ගෙවන ජනතාවට විශාල සේවයක් ඉටු වෙතැයි බලාපොරොත්තු වන නමුත් මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රුපියල් ලක්ෂ 03 ක මුදලක් ලබා දීම ප්‍රමාණවත් නොවන බව සඳහන් කළේය. අතිගරු ජනාධිපතිතුමා හා අගමැතිතුමා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන නිසාත් ඉදිරියේ දී පවත්වන පළාත් සභා මැතිවරණය පොදු ජන පෙරමුණ ජයග්‍රහණය කරන බැවිනුත් ඉහත යෝජනා ඉටු කිරීම සඳහා ලබා දෙන ප්‍රතිපාදන පළාත් සභා

මඟින් ලබා ගැනීම කළ හැකි බව පැවසීය. නමුත් ඒ සඳහා පොදු ජන පෙරමුණේ සභාපතිවරයෙක් පත්ව සිටිය යුතු බැවින් ඒ වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් 2020 අයවැය ප්‍රකාශය ඉතාමත් හොඳින් සකස් කර ඇති බැවින් ඒ සඳහා ගණකාධිකාරිතුමා ඇතුළු සියළුදෙනාට ස්තුතිය පුද කළ අතර මෙම අයවැය ප්‍රකාශය කල් ඇතිව ලැබුණේ නම් වඩාත් සුදුසු බව ද මෙතෙක් කල් සභාවේ කටයුතු කළ ආකාරයටම ඉදිරියටත් සාමූහිකව කටයුතු කරමු යි පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**</u>

2002 වර්ෂයේ සිට තමා මෙම සභාවේ සභිකයෙකු ලෙස සිටි අතර එවකට පළාත් සභාවේ බලය නොමැති නිසා වැඩ කිරීමේ අපහසුතාවයක් ඇතිවී මෙලෙසම අසරණ වූ අතර ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අයවැය ලේඛනය සභාව පැවැත්වීමට දින හතකට පෙර ලබා දුන්නානම් හොඳයි යැයි පැවසුවද හිටපු සභාපතිතුමාගේ කාලයේදීද එලෙස ලබා නොදුන් බව පවසා සිටින ලදී.

2015 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ව ආණ්ඩුව පිහිටුවා ගත්ත ද අතිගරු ජනාධිපතිතුමා හා අගමැතිතුමා පක්ෂ දෙකක වීම නිසා ආණ්ඩුව නිසියාකාරව පවත්වාගෙන යාමට නොහැකි වූ අතර ඔවුන් දෙදෙනාගේ විරසක වීම මත දින 51 ආණ්ඩුව පිහිටුවන ලද නමුත් එහි දී හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා නීතිමය ක්‍රියාමාර්ග ලබා ගනිමින් සාධාරණය ඉටු කර ගත් බව පැවසීය. ඉන් අනතුරුව එක්සත් ජාතික පක්ෂය තනි ආණ්ඩුවක් ලෙස කටයුතු කළ ද ජනාධිපතිතුමාගේ නිරන්තර බාධාකිරීම් නිසා එය පවත්වා ගෙන යාමට අපහසු වූ බව සඳහන් කළේය.

එමෙන්ම 2019 ජනාධිපතිවරණයෙන් පසු හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජාතිය ඇමතු අවස්ථාවේදී එතුමා ජනාධිපති කිරීමට අවශ්‍ය කටයුතු කරමින් ඡන්දය ලබාදුන් එක්සත් ජාතික පක්ෂයට හා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් කිසිවෙකුට ස්තුති නොකිරීම විශාල අඩුපාඩුවක් බව පෙන්වා දෙන ලදී. 2018 පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ආසන 03 ක් දිනා ගත් අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අන්ත පරාජයක් ලබා ගත් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මෙම පක්ෂ දෙකම එකතු වී නගර සභාවේ බලය පිහිටු වීමෙන් අනතුරුව එවර අයවැයෙන් සෑම මන්ත්‍රීවරයෙක් සඳහාම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රුපියල් 400,000.00 ක ප්‍රතිපාදන මුදලක් ලබා දුන් බව පැවසීය. එහි දී එක්සත් ජාතික පාක්ෂිකයන්ට පමණක් යැයි කිසිදු විශේෂයක් සිදුකර නොමැති අතර ඇතැම් අවස්ථාවලදී තමාට වඩා වැඩි ප්‍රතිපාදන මුදලක් උප සභාපතිතුමාට ලබා දී ඇති බවත් පවසන ලදී.

ඊට අමතරව රුපියල් ලක්ෂ 03 ක ප්‍රතිපාදනයන් ලබා දුන් අතර දෙහිගස්තලාව කොට්ඨාශය සඳහා ගම්පෙරළිය වැඩසටහන මඟින් ද සංවර්ධන කටයුතු කළ බව පැවසූ ගරු මන්ත්‍රීතුමා හිටපු

සභාපතිතුමාගේ කාලයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 10 ක් ලබා දෙන විට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දුන්නේ ලක්ෂ 2 ක් පමණක් බව පැවසීය. එබැවින් තමන් මෙම අයවැය පිළිබඳ ඉතාමත් සතුටු වන අතර සැමටම එක හා සමානව සැලකූ ගරු සභාපතිතුමාට කිසිදු චෝදනාවක් නොකරන ලෙස වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම පසුගිය ජනාධිපතිවරණය බැනර් කටවුට් පෝස්ටර් වලින් තොරව සාමකාමීව පැවැත්වීම සම්බන්ධව මහජනතාවට ස්තුතිය පුද කර සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සියළු ජාතීන්ගේ ජනාධිපති ලෙසත්, රටේ යුද්ධය නිම කිරීම නිසා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් තමා ගරු කරන බව පවසා සිටින ලදී. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමා සියළු ජාතීන් සඳහා එක සේ සළකනු ඇතැයි බලාපොරොත්තු වන අතරම හිටපු සභාපතිතුමාගේ කාලයේ පැවති අයවැයක දී ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලෙස පක්ෂ මූලස්ථානය වූ සිරිකොතෙන් ලිපියක් ලැබුණු නමුත් තම කණ්ඩායම එසේ නොකළ බව ද මින් ඉදිරියටද සියළු දෙනා එක්ව බළන්ගොඩ බදු ගෙවන ජනතාවට සේවය කරමු යැයි පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඕලුගංතොට ඇල්ෆාවත්ත දංපිටිය මාර්ගයේ විශාල ජනතාවක් ජීවත් වන බැවින් එම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ගරු සභාපතිතුමාට කිහිපවරක් පැවසුවද එය ඉටු නොකිරීම පිළිබඳව තම කණගාටුව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ලක්ෂ 69 ක ඡන්ද ප්‍රමාණයක් ලබා ජයග්‍රහණය කළ අතර ඉන් වැඩි ප්‍රමාණයක් සිංහල ඡන්ද බව තමා ඉතාමත් ආඩම්බරයෙන් පවසන බව පවසන ලදී.

2018 වර්ෂයේ තමා වෙත ලබා දුන් මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් සියඹලාවත්ත මාර්ගයේ පැති බැම්මක් ඉදි කළ බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා 2020 කෙටුම්පත් අයවැය ප්‍රකාශය සඳහා තම පක්ෂය ගනු ලබන තීන්දුව සමඟ තමා ද සිටින බව පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම වසරේ අගෝස්තු මස සිට ඇදහැලුණු ධාරාණිපාත වර්ෂාව නිසා කිසිදු සංවර්ධන හෝ නඩත්තු කටයුත්තක් සිදු කිරීමට නොහැකි වූ බව පවසන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, සභාව පත්වී වසර එක හමාරක් ගත වී ඇති අතර එම කාලය තුල අඩුම අවධානය ලැබූ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් අද දින

තමන් සභාවේ කථා කරන බව ද, 2019 වර්ෂයේ අයවැය සඳහා බුලත්ගම කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස යෝජනා 21 ක් ඉදිරිපත් කළ නමුත් ඉන් එක් කර්මාන්තයක්වත් ඉටු කර නොමැති බව ද පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.400,000.00 ක මුදල පමණක් මෙතෙක් ලැබුණු බව ද පවසන ලදී.

එමෙන්ම පුබුදමු ගම්මැද්ද වැඩසටහන මගින් තුඹගොඩ, බුලත්ගම හා හුනුකුඹුර කොට්ඨාශ දැනුවත් කිරීමේ වැඩසටහන වැවවත්ත ප්‍රජා ශාලාවේ පවත්වන අවස්ථාවේදී ගරු සභාපතිතුමා එම රැස්වීම අමතමින් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා තම පක්ෂයේ යෝජනා පමණක් ගෙනෙන නිසා ප්‍රජාවගේ සමස්ථ යෝජනා ලබා ගැනීම සඳහා මෙම රැස්වීම පවත්වන බව පැවසීමෙන් එම අවස්ථාවේදී කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස තමන් අපහසුතාවයට පත්වූ බව පවසන ලදී.

එසේම තමන් බුලත්ගම කොට්ඨාශයේ පුබුදමු ගම්මැද්ද වැඩසටහන සඳහා යෝජනා 16 ක් ලබා දුන්න ද, ඉන් රු.10,500.00 ක මුදලක් යොදවා පල්ලෙවත්ත ළිඳ කපරාදු කිරීමේ කර්මාන්තය පමණක් සිදු කළ අතර එම ළිඳ ඉසීම සඳහා ජල මෝටරය මේ වන තෙක් ලබා නොදීම නිසා අද වන විට එම ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත්ව ඇති බව පවසන ලදී. එමෙන්ම තමන් ගරු සභාපතිතුමාගෙන් සුනන්දාරාම පාර ජල ව්‍යාපෘතිය ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් කළ ද එය ලබා නොදුන් බැවින් ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා මගින් ප්‍රතිපාදන ලබා ගෙන එම කර්මාන්තය කළ බවත්, තමන් බුලත්ගම කොට්ඨාශයේ නාගරික මන්ත්‍රී ලෙස සිදු කළ එකම ව්‍යාපෘතිය මෙය පමණක් බවත් පවසන ලදී.

එමෙන්ම මෙවර අයවැය කෙටුම්පත් ලබා දීමේ ක්‍රමවේදය විධිමත්ව කළ යුතුව තිබූ අතර මෙය අධ්‍යයනය කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම පිළිබඳ තමාගේ බලවත් විරෝධය ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම බස්නැවතුම්පල සඳහා ලබා ගත් ණය ගෙවීම බස්නැවතුපළ හා මහජන පොළ මගින් ලැබෙන ආදායමෙන් පමණක් සිදු කළ හැකි බව ද වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් හඳුන්වා දී නොමැති බව ද පවසන ලදී. බස් නැවතතුම්පල වෙළෙඳ සංකීර්ණයේ සූර්ය විදුලි පද්ධතිය ස්ථාපනය කිරීම නගර සභාව වෙත ආදායම් උත්පාදනය කළ හැකි හොඳම ක්‍රමයක් බව තමා එක් අවස්ථාවකදී යෝජනා කළ ද එම සභාවෙන් පසු ගරු සභාපතිතුමා ඒ පිළිබද වචනයකුදු කථා නොකළ බව පවසන ලදී.

2016-2017 වර්ෂ සඳහා රන් අස්වනු සම්මාන උළලේ ලකුණු 414 ක් ලබා ගනිමින් බළන්ගොඩ නගර සභාව පළමු ස්ථානය ලබා ගත් නමුත් පෙර වර්ෂය හා සැසඳීමේ දී ගරු සභාපතිතුමාගේ කාලයේ දී ලකුණු 66 ක ප්‍රමාණයක් අඩු වී ඇති බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා එම අවස්ථාවේදී යටිතල පහසුකම් සඳහා කිසිදු ලකුණක් හිමි කරගෙන නැති අතර හුරුවුනු වැඩ පිළිවෙලක් සඳහා පමණක් ලකුණු ලබා ගෙන ඇති බව පවසන ලදී.

2019 වර්ෂයේ අයවැය මගින් රුපියල් ලක්ෂ 150ක ප්‍රමාණයක් මංමාවත් හා කාණු නඩත්තු කිරීම සඳහා වෙන් කර තිබුණ ද ජනතාව ගරු සභාපතිතුමාගේ සේවාව පිළිබඳ කිසිසේත්ම තෘප්තිමත් නොවන බව ආසියානු පදනම හා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදුකල ECRC

සමීක්ෂණයේ සඳහන් වී ඇති බව පැවසීය. එමෙන්ම සංවර්ධන කටයුතුවල දී තම පක්ෂය නොසලකා හැරීම නිසා අද දින ගෙන ආ අයවැය කෙටුම්පතට හා දෙසැම්බර් 10 වන දින ගෙන එන කෙටුම්පත සඳහා තම විරෝධතාවය ප්‍රකාශ කර සිටින ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එම ECRC වැඩසටහන මඟින් සිදු කල සමීක්ෂණය පවත්වා තිබුණේ තමා සභාපති ලෙස පත් වී මාස තුනක කාලයක් ඇතුලත බැවින් හා සමීක්ෂණය තුලින් මහජනතාව අදහස් දක්වා තිබුණේ සභාව නොමැති කොමසාරිස් පාලනය පැවති කාලය සම්බන්ධව බව පවසන ලදී. එමෙන්ම රන් අස්වනු සම්මාන උළලේ ලකුණු අඩුවීම සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුවේ එම සම්මාන උළෙල පැවතුණේ සභාව පත් වී මාස තුනක කාලයක් ඇතුලත දී බවයි. එබැවින් මෙම චෝදනා කාලානුබෝධයකින් තොරව ඉදිරිපත් කිරීම පිළිබඳව තම කණගාටුව ප්‍රකාශ කරන බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමා බළන්ගොඩ නගරයේ මන්ත්‍රීවරයා බැවින් ජනතාව විසින් නගරයේ ගැටළු තමන් වෙත ඉදිරිපත් කරන ලද අතර එම ගැටළු තමා විසින් සභාව වෙත ඉදිරිපත් කරන බව පැවසීය. ඒ අනුව ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම හා ඇවිදින මංතීරුව සකස් කිරීම පිළිබඳව සෑම සභා වාරයක දීම ඉදිරිපත් කළේ කෙසේ හෝ එම කාර්යයන් ඉටු කර ගත යුතු නිසා බවත්, තමා නගර සභාවට නවක මන්ත්‍රීවරයෙකු වුවද අවුරුදු 15 ක කාලයක සිට වෙළෙඳ සංගමයේ සභාපති වශයෙන් මෙම සභාවේ වැඩ කටයුතු සඳහා සහභාගි වූ බැවින් තමාට සභාවේ කටයුතු සම්බන්ධව යම් අවබෝධයක් ඇති බවත් පවසන ලදී.

එමෙන්ම මෙවර අයවැය හොඳ අයවැයක් වුවද පසුගිය වසරේ දී ගෙන ආ අයවැය අනුව කටයුතු කිරීමට නොහැකි වීම පිළිබඳ කණගාටු වන අතර 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය අග දක්වා රුපියල් ලක්ෂ 4 ක මුදලක් පමණක් ලැබුණු බව පැවසීය. මෙම අයවැය කථාව 2019 වර්ෂයේ අයවැය සඳහා ඉදිරිපත් කළේ නම් හොඳ බවත්, අඩුපාඩු පමණක්ම නොව හොඳ දේවල් ද පවතින බවත් පවසා සිටින ලදී.

එසේම, නාගරික මන්ත්‍රීවරයා යනු ඕනෑම ප්‍රශ්නයක් පැවසිය හැකි පුද්ගලයෙක් ලෙස මහජනතාව විසින් පිළිගනු ලබන අතර මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් වසර දෙකක කාලය සඳහාම රුපියල් ලක්ෂ 4 ක මුදලක් පමණක් ලැබීමෙන් එමගින් ඉටු කළ හැකි සංවර්ධනය කුමක්දැයි විමසන ලදී. එමෙන්ම මහජන පොළ වැසිකිළිය අබලන් වී ඇති බව ද වැසිකිළි ආධාර ලබා දීම ඉක්මනින් සිදු කරන ලෙස ද පවසන ලදී. මින් ඉදිරියට සභාව කවුරුන් විසින් කළ ද මෙම අඩුපාඩු සකස් කරගැනීම අත්‍යවශ්‍ය බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා ඔරලෝසු කණුව නඩත්තු කිරීමේ කටයුත්ත වෙළෙඳ සංගමයට ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමාට තම ස්තුතිය පුද කර සිටින බව පැවසූ අතර කණ්ඩායමක් වශයෙන් ගන්නා තීරණය සඳහා තමා අවනත වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා සඳහා ඡන්දය ලබා දුන් ලක්ෂ 55 ක ජනතාව සඳහා ස්තුතිය පුද කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවසීය. එමෙන්ම බළන්ගොඩ නගර සභාවේ සභාව පැවැත්වූ පසුගිය අවුරුදු එක හමාරක කාලයත්, 2019-11-16 දින සිට 2019-11-26 දක්වා කාලයත් යන අවස්ථා දෙකෙහි දී සභාවේ සාමාජිකයන්ගේ පැහැදිලි වෙනසක් දුටු අතර ඉදිරියක් දකින තරුණ නායකයෙක් වශයෙන් ගරු සභාපතිතුමාට සහයෝගය ලබා දුන්නේ කුමන මිනිසුන් ද යන්න තේරුම්ගත හැකි බව පවසන ලදී.

මෙය දේශපාලන යථාර්තය වන නමුත් දේශපාලනය මෙතරම් කුහකයැයි තමා නොසිතූ බව ද විපක්ෂයේ සභිකයන් මෙම වසර එක හමාර තුල නොදැකපු අඩුපාඩු මෙම දින දහය තුල දුටුවේ කෙසේද යන්න විමසා සිටි ගරු මන්ත්‍රීතුමා තමන්ගේ පක්ෂය බඩ වඩා ගැනීම සඳහා මෙම සභාවට නොපැමිණි බවත් තමා කෙදිනකවත් සභාව වැටෙන ලෙස කටයුතු නොකරන බවත් පවසන ලදී.

එමෙන්ම කවුරු කෙසේ කටයුතු කළද බළන්ගොඩ ජනතාවට අසාධාරණයක් වන කිසිඳු දෙයක් තමා නොකරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා තම පක්ෂය සභාවේ බලය ලබා ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ වුවද ඔවුන්ගේ කැමැත්ත තම පක්ෂය වෙත බලෙන් ලබා නොගත් බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, අනාගතයක් දකින සභාපතිවරයෙක් ලෙස ගරු සභාපතිතුමාට මෙම සිදුවන දේවල් දරාගත හැකි අතර නිළධාරී සියළු දෙනා එක්ව සකස් කළ මෙම අයවැය කාලෝචිත අයවැයක් බැවින් ඒ පිළිබඳව ලේකම්තුමිය ගණකාධිකාරිතුමා ඇතුළු සියළු නිළධාරීන්ට සුභපතන බව පවසා සිටියේය. බළන්ගොඩ නගරයේ පුරවැසියන්ට මෙවර අයවැය මගින් ඉතා සාමකාමී වර්ණවත් දිවියක් ගත කිරීමට හේතු වාසනා ලැබේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින්, ගරු උප සභාපතිතුමා ලබා දෙන බව කියූ දේවල් ලබා නොදුන්නැයි පවසා තලතා අතුකෝරළ මැතිතුමියට චෝදනා කළ නමුත් එය සිදු වූයේ දින 51 ආණ්ඩුවෙන් පසු එක්සත් ජාතික පක්ෂය හිටපු ජනාධිපතිතුමා සමඟ වැඩ නොකරන බවට ගත් තීන්දුව නිසා බව පවසන ලදී. එමෙන්ම ගම්පෙරළිය වැඩ සටහන යටතේ ඕලුගංතොට කොට්ඨාශය සඳහා ලක්ෂ 51 ට වැඩි වැඩ කොටසක් සිදු කළ අතර ඉතිරි වැඩ කටයුතු සඳහා නිමල් කරුණාරත්න මැතිතුමාට කිසි දිනෙක තමා අකුල් නොහෙලන ලද බව ද එතුමාට ගරු ජනාධිපතිතුමාගේ හා ගරු අගමැතිතුමාගේ ප්‍රතිපාදන ලබා ගනිමින් සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමන් විසින් තමන්ව පඹයෙක් ලෙස තබා ගත්තා යැයි ගරු උප සභාපතිතුමා චෝදනා කළ අතර, එලෙස තබා ගැනීමට අවශ්‍ය බැවින් ඩබ්. එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා උප

සභාපති ලෙස පත් නොකිරීමටත් එම්.ටීඑම්.රූමි මැතිතුමා පත් නොකර ඩබ්. එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා උප සභාපති වූවානම් මේ තත්ත්වය මීට වඩා වෙනස් වන බව ගරු සභාපතිතුමා දැන සිටි බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ නාගරික මන්ත්‍රීතුමා විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් අයවැයේ පවතින දෝෂ සහගත බව නිසා නොව බලය ලබා ගැනීමට අවශ්‍ය නිසා මෙයට විරුද්ධ වන බව ද තමා මෙවර අයවැයට පක්ෂව ඡන්දය දෙන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මෙය ඉතා හොඳ අයවැයක් වන අතර එය සකස් කිරීම පිළිබඳ ගණකාධිකාරීතුමාට ස්තූතිය පළ කර සිටින ලදී. එමෙන්ම ගරු උප සභාපතිතුමා හිටපු අධිකරණ බන්ධනාගාර හා ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරළ මැතිතුමියට දෝෂාරෝපණය කිරීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කර සිටි අතර කණ්ඩායම් රැස්වීමකදී හෝ එතුමිය ගරු උප සභාපතිතුමාට කිසිවක්ම නොකියා ඇති බවත් තමන් හා තරංගනී මන්ත්‍රීතුමිය විශාල වගකීමක් ගනිමින් ගරු උප සභාපති ලෙස පත් කිරීම සඳහා යෝජනා ස්ථිර කළ බවත් පවසන ලදී.

එමෙන්ම ගම්පෙරළිය වැඩසටහන මඟින් තමාට වැඩසටහන් පැමිණි අවස්ථාවේදී තමන් උප සභාපතිතුමාගෙන් නම් කිහිපයක් ඉල්ලූ නමුත් එය ලබා නොදුන් බව ද සියලු දෙනා සමඟම එකට ගමනක් යාම සඳහා තමා සූදානම් බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, අවුරුද්දයි මාස ගණනක් තුළ තමන් බොහෝ දේ ඉගෙන ගත් බවත් ගරු නාගරික මන්ත්‍රීවරුන් දෙපළක් වන වසන්ත මන්ත්‍රීතුමා හා නදීශාන් මන්ත්‍රීතුමා ආවේගශීලීව කථා කිරීම පිළිබඳ ඉතා කණගාටු වන බවත් පවසන ලදී. ගරු සභාපතිතුමා පක්ෂයේ සාමාජිකයන් සඳහා වැඩිපුර මුදල් ලබා නොදුන් අතර පැන නගින කුමන ප්‍රශ්නයක දී වුව ද විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන බැවින් ගරු සභාපතිතුමා හට දෝෂාරෝපණය නොකරන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙම අයවැය අධ්‍යයනය කිරීමට නොහැකි වූ අතර තමා මෙම අයවැයට පක්ෂව ඡන්දය දෙන බව ද සියළු මන්ත්‍රීවරුන් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන වෙන් කරන ලෙස ද පවසන ලදී. එමෙන්ම ගරු උප සභාපතිතුමා නම් කරන අවස්ථාවේදී සභාව ගෙන යාමට පහසු බැවින් එම්. ටී. එම්. රූමි මැතිතුමා පත් කළ ද ඔහු වෙනස් වෙන පුද්ගලයෙක් කියා කිසි දිනක නොසිතූ බව පැවසීය. එතුමා තලතා අතුකෝරල

මැතිතුමියට චෝදනා කළ ද තම පක්ෂයෙන් සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් සඳහා උදව් කරන ලෙස උපදෙස් ලබා දුන් බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින්, තමා මෙම සභාව සඳහා කාන්තා නියෝජනයක් ලෙස පැමිණි අතර 2020 වර්ෂයේ අයවැය මෙම කාලය තුළ ගෙන ආ දෙවෙනි අයවැය බැවින්, තමන් මේ පිළිබඳව පළපුරුද්දක් ඇති අයකු නොවන බව පවසන ලදී.

එමෙන්ම තමා හොඳ හොඳ ලෙසත් නරක නරක ලෙසත් දැකීමට වෘත්තීය ජීවිතයේදීද කැප වී සිටින බව පවසන ලදී. මේ වන තෙක් මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලක්ෂ 4ක මුදලක් ලබා දී ඇති අතර අයවැය ලෙස ඉදිරිපත් කරන්නේ හොඳ දේවල් පමණක් වුවද ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පවතින බව පවසන ලදී.

ගරු සභාපතිතුමාට රුපියල් ලක්‍ෂ 05ක් දක්වා වූ වියදම් අනුමත කිරීමට තමා අදටත් විරුද්ධ බව පවසා සිටි ගරු මන්ත්‍රීතුමිය ගරු උප සභාපතිතුමා අවස්ථා කිහිපයකදීම තමන්ට නගර සභා කාර්යයන් පිළිබඳව ලැබෙන දැනුවත් කිරීම් ප්‍රමාණවත් නොවන බව පැවසූ අතර කුමාරගම කොට්ඨාශය සඳහා මන්ත්‍රීවරුන් හතර දෙනෙකු සිටිය ද එම කොට්ඨශයේ සිදු කරන සංවර්ධන කටයුතු සඳහා සිදු කරන ආරාධනා ප්‍රමාණවත් නොවන බව පවසා සිටියාය.

වැඩිදුරටත් අදහස් දක්වමින් සභාවේ සභිකයන් අතර සිදු කරන සාකච්ඡා ප්‍රමාණවත් නොවන බව ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් තිදෙනා සභාවේ තත්ත්වය තීරණය කරන සාධකය වන බැවින් තම පක්ෂය සඳහා ලැබුණු වරම නිවැරදිව ක්‍රියාත්මක කළ යුතු බව පවසන ලදී. එබැවින් තම පක්ෂයේ ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරුන් දෙදෙනා අයවැය පිළිබඳ දරණ මතයෙහි තමන් සිටින බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් මේ වන විට සභිකයන් 14 දෙනෙකු අදහස් දක්වා අවසන් බැවින් අයවැය ලේඛනය සම්බන්ධව තමන් පූර්ව නිගමනයක සිටින බව පවසන ලදී. තමා ජනාධිපතිවරණයත් සමග කායිකව හා මානසික වෙහෙසට පත්වී සිටින අතර ජාතික ජනතා ව්‍යාපාරය සඳහා ලක්ෂ 10 ක ඡන්ද ප්‍රමාණයක් බලාපොරොත්තු වූ නමුත් එම ප්‍රතිඵලය නොලැබීම නිසා කණගාටුවට පත්වන බව පවසන ලදී.

පාස්කු ප්‍රහාරයත් සමග මෙරට ජනතාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 ම ප්‍රතික්ෂේප කළ බැවින් කිසිඳු දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් නොවන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ

ජනාධිපතිවරණය සඳහා තරග කළ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනතාව පිළිගත් බව ද සංඝයා වහන්සේලාගේ සහයෝගය එතුමාට විශාල වශයෙන් ලැබුණු බව ද පවසන ලදී.

එමෙන්ම 2015 වර්ෂයේ ජනාධිපතිවරණයත් සමග තමා ජනතා විමුක්ති පෙරමුණට පැමිණි බව පැවසූ නාගරික මන්ත්‍රීතුමා ජනතා විමුක්ති පෙරමුණ විසින් 2005 වර්ෂයේ ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් 2010 වර්ෂයේදී සරත් ෆොන්සේකා මැතිතුමාටත් 2015 වර්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් සහය දැක්වූ අතර 2019 වර්ෂයේදී පක්ෂයක් ලෙස වෙනම තරග කළ බව පවසන ලදී. එසේම උතුරු නැගෙනහිර ජනතාව මෙවර විශාල වශයෙන් ඡන්දය භාවිතා කළ අතර සමහර ප්‍රදේශවල දෙමළ ජනතාව 90%ක ප්‍රමාණයක් ඡන්දය භාවිතා කර තිබූ ආකාරයෙන් එම ජනතාව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට වඩා ඔහු වටා සිටින පිරිසට බිය වූ බව පවසන ලදී.

2019 දී බලයට පත්වූ රජය මීට වඩා සේවාවක් ඉටු කරනු ඇතැයි ජනතාව බලාපොරොත්තු වන අතර ජය පරාජය කාටත් පොදු කාරණයක් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයේ පිරිසක් මහ මැතිවරණයේදී විරුද්ධ පක්ෂය වෙත යන බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රීතුමා අයවැය තුල පසුගිය අවුරුදු වල ගෙන ආ යෝජනා ගනණාවක් තිබූ අතර ඒවා ඉෂ්ඨ නොවූ බව ද උඩ ඇල්ලෙපොල ගල්පොත්ත ප්‍රදේශයේ වේ ගඟ හරහා පාලමක් ඉදි කිරීම, නගර සභා බල ප්‍රදේශයේ අතුරු මාර්ග සඳහා දැන්වීම් පුවරු සකස් කිරීම, දුනුමඩල ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම, ජාතික පාසල පිටිපස මාර්ගය සංවර්ධනය කිරීම, දුනුමඩලගහවත්ත කාණු පද්ධතිය ඉදි කිරීම ආදී සංවර්ධන කටයුතු එම යෝජනා අතර ඇති බව පවසන ලදී. එමෙන්ම හිස් ඉඩම් තුලට හිස් බෝතල් ආදී කුණු කසළ ඉවතලන බැවින් එම ඉඩම් සඳහා ප්‍රාග්ධන වටිනාකමින් 2% ක් බදු ලෙස අය කිරීමට හැකියාවක් පවතින බවත් එසේ අය කිරීම තුළ ඔවුන් එම ඉඩම් සංවර්ධන කිරීමට පෙළඹෙන බවත් පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තමන් සභාවට තේරීපත් වූ මන්ත්‍රීවරියක් ලෙස පැමිණි අතර 2018 වර්ෂයේ රුපියල් ලක්ෂ 4 ක මුදලක් ලබා දුන් බවත්, එතුලින් අවශ්‍ය සංවර්ධනය ඉටු කිරීමට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් අවස්ථාව ලබා නොදී කෙනෙහෙළිකම් කළ නමුදු ගරු සභාපතිතුමා දැක් වූ සහයෝගය සම්බන්ධව ස්තුතිය පළ කරන බවත් පැවසීය. එමෙන්ම 2019 වර්ෂයේදී ද මන්ත්‍රී ප්‍රතිපාදන ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වුවද එය නොලැබුනු අතර ගම්පෙරළිය තුලින් රට තුළ කුමන පෙරළියක් කළද ලංකාව සඳහා අවශ්‍ය කුමන නායකයා ද යන්න ජනතාව තීරණය කර ඇති බව පවසන ලදී.

එමෙන්ම තමා සංවර්ධන කටයුතු ආදිය සිදු කිරීමේදී දේශපාලන පක්ෂයට වාසි වන ලෙස කටයුතු නොකළ නමුත් මෙම සභාව තුළින් තම පක්ෂයට සාධාරණයක් නොවූ බැවින් මෙම අයවැය පිළිබඳ සෑහීමකට පත් නොවන බවත්, 2020 අයවැය පළමුවර කියවීම පිළිබඳ තම පක්ෂය ගන්නා තීරණය සමඟ සිටින බවත් පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා</u>**

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින්, 2003-2004 වර්ෂයේ දී අයවැය සඳහා සභාවේ සභිකයන් කඩු කිනිසි ආදිය රැගෙන පැමිණි වාතාවරණයක් තිබූ අතර තමාට අද දින සභාව තුළ බෝම්බයක් ගැසුවද දරාගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය තිබෙන බව ද, බළන්ගොඩ නගර සභා ඉතිහාසයේ ලාබාලතම සභාපතිවරයා ලෙස දුෂ්කරම කාලයක් ගත කරන්නේ තමා බව ද පවසන ලදී. දැඩි අපහසුතා දුෂ්කරතා හා කුණාටුවලට හසුවී දේශපාලනය උඩු යටිකුරු වූ යුගයක් මීට පෙර නොතිබූ අතර තම පියාගේ පාලන සමයේදී පළාත් සභාවල බලය නොතිබුණද සභාවේ බලය ඔහුට තිබූ නමුත් අද දින තමාට මෙම සභාව තුළද බහුතරයක් නොමැති බව පවසා සිටින ලදී. එමෙන්ම සියළු දෙනාගේ බාධා කිරීම් මැද තමාට විරුද්ධව ඇටවූ උගුල්,බොරු වලවල්, කේලම්, චෝදනා සමග වංචාව, දූෂණය හා නාස්තියෙන් තොරව ගමනක් ගිය බව වැඩිදුරටත් පැවසූ ගරු සභාපතිතුමා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා බලහත්කාරයෙන් හා වංචාවෙන් සභාව ගත් බවට චෝදනා කළ නමුත් කිසිදාක එසේ නොකළ බවත්, එදා තිබූ දේශපාලන වටපිටාව හා ක්‍රමවේදයන් තුළ තමාගේ නායකතුමිය හා පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ගේ උපදෙස් හා එකඟතාවයන් මත ක්‍රියා කළ බවත් පවසන ලදී.

එමෙන්ම සභාපති වීම පිළිබඳ විශේෂ සතුටක් හෝ දුකක් නොමැති අතර මැදිහත් සිතින් විඳ දරා ගැනීමේ හැකියාවක් තමාට පවතින බව සඳහන් කළේය. තමා කුඩා කළ සිට දුක් කම්කටොළු පිරි ජීවිතයක් ගත කළ අතර ඒ සෑම අවස්ථාවකදීම තමා තනිවූ බව ද එම අවස්ථාවල දී තමන් තනිවම නැඟී සිටි බැවින් එම හැකියාව මෙම අවුරුදු 1 1/2 තුළ තවත් ප්‍රගුණ වූ බව ද පවසන ලදී.

මෙම සභාවෙන් ගෙන යාම සඳහා කිසිඳු දෙයක් තමාට නොමැති බව පැවසූ ගරු සභාපතිතුමා තමා වැරදි, වංචා හා දූෂණ වලින් තොරවූ බැවින් කිසිඳු අවස්ථාවකට බියවීමට අවශ්‍ය නොමැති බව පවසන ලදී.

එසේම ගණකාධිකාරිතුමාට කළ චෝදනාව තරයේ හෙළා දකින අතර අද ලංකාවේ සිටින ඕනෑම ගණකාධිකාරවරයෙකු ගරු කරන ලංකාවේ හොඳම ගණකාධිකාරවරයා එතුමා බව පවසන ලදී. එමෙන්ම එතුමා පැමිණි දා දින සිට සභාවට නිවැරදි අයවැයක් ඉදිරිපත් වූ අතර ලංකාවෙන්ම මූල්‍ය ප්‍රකාශන මගින් දෙවරක්ම ප්‍රථම ස්ථානය ලබා ගත් බව පවසන ලදී. එබැවින් අයවැය ලේඛනය සකස් කිරීම සඳහා දායකත්වය ලබාදුන් ගණකාධිකාරිතුමා ඇතුලු එතුමාගේ කාර්ය මණ්ඩලයට හිස නමා ආචාර කරන බවත් සභාවේ සියළු දෙනා වෙනුවෙන් ස්තුතිය පුද කරන බවත් පවසන ලදී.

වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, කුමන අඩුපාඩුව තිබුණද සියළු දෙනා එක්ව පොදු ගමනක් යාම සඳහා උත්සාහ කළ නමුත් තමාට විරුද්ධව ඇමතිතුමිය වටා විශාල බලවේගයක් ක්‍රියාත්මක වී ඇමතිතුමියට කේලම් කියූ නිසා නගර සභා මහජන පොළ, පොදු වෙළෙඳසැල හා ක්‍රීඩාපිටිය සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට එතුමියගේ සහයෝගය තමාට නොලැබූ බැවින් ගරු

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මැතිතුමා හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මැතිතුමා හමුවට ගොස් ඔවුන්ගේ සහයෝගය ලබා ගත් බව පවසන ලදී. තම පක්ෂයේ සියලු දෙනා වෙනුවෙන් සියළු දෙනාගේ තර්ජන ගර්ජන චෝදනා තමා තනිව විඳදරා ගන්නා බවත් තමා පිළිබඳ ඇමතිතුමියට කේලම් පවසා ඇති ආකාරයට ලබන වර පක්ෂ අපේක්ෂකත්වයද නොලැබී යනු ඇතැයි පවසන ලදී.

මෙම අයවැයෙන් අඩුපාඩු සිදු වී ඇත්නම් ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලෙස පැවසූ ගරු සභාපතිතුමා මෙම අයවැය පැරදුණ ද ජයග්‍රහණය කළද එකට යා හැකි වුව ද නිසි වෙලාවේ දී තනතුරු වලින් බැහැර වන බවත් සභාවේ අලංකාරය හා ගුණාත්මක භාවය ආරක්ෂා කිරීමට බෙදීමකට නොයා සංශෝධන ඉදිරිපත් කරන ලෙසත් පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වන අවස්ථාවේදී දින 10 ක් තුළ සභාවේ සභිකයන් වෙනස් වූ බව පැවසුවද තමා මෙම සභාවට පැමිණි දා සිටම සභාවේ බලය ලබා ගත යුතු බවට පැවසූ බවත් තම පක්ෂයට ඇති අයිතිය ලබා ගැනීම සඳහා මෙම සභාව ලේසියෙන් අතනොහරින බවත් වැඩිදුරටත් පැවසීය.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා</u>**

නැවත වරක් අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා, තමන් ගරු සභාපතිතුමා 100% ක් විශ්වාස කරන අතර ගරු සභාපතිතුමා එතුමාගේ පක්ෂයේම අභියෝගයකට ලක්වී අර්බුදයක් හටගත් බව ද තමන් පක්ෂයක් වශයෙන් පක්ෂයේ තීන්දුවකට හිස නැමිය යුතු බැවින් 2020 වර්ෂයේ අයවැය කියවීමට විරුද්ධව ඡන්දය පාවිච්චි කර බවද පවසන ලදී.

2020 වර්ෂයේ අයවැය සඳහා එයට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් වූ බැවින් හා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් විවෘත ඡන්දයක් පැවැත් වූ අතර එහිදී යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙක්ද, එනම්,

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |

මෙහිදී යෝජනාවට විරුද්ධව සභිකයින් එකොළොස් දෙනෙක්ද, එනම්,

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

ඡන්දය ලබා දෙන ලදී. ඒ අනුව **2020 වර්ෂයේ අයවැය පළමුවර කියවීම වැඩි ඡන්ද පහකින් (05කින්) පරාජයට පත්විය.**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අද දින අයවැය පරාජය වුවද ඉදිරියේදී තමාගේ ශක්ති ප්‍රමාණයෙන් සභාව ඉදිරියට කරගෙන යන බවත් අයවැයේ පවතින අඩුපාඩු නිසා නොව දේශපාලන මතිමතාන්තර නිසා විරුද්ධ පක්ෂයේ සභිකයින් අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ අතර 2020 වර්ෂයේ අයවැය පළමුවර ඉදිරිපත් කිරීමේ විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාධ්‍යවේදීන් සියළු දෙනාටත් ස්තුතිය පළ කරමින් ප.ව.2.00ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණ විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව